සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024**
**General Certificate of Education (Adv. Level) Examination, 2024**

| | | |
|---|---|---|
| **සිංහල I** | | |
| சிங்களம் I | **71 S I** | |
| Sinhala I | | |

| | | |
|---|---|---|
| *පැය තුන යි* | **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි** |
| *மூன்று மணித்தியாலம்* | மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| *Three hours* | Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
※ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ඒ අසා බමුණාණෝ පුතණුවන් මියයා ම ත්‍යාග අදහස බලවත් වූවා සේ 'ළදරුවාණෙනි, තොපි ඉල්වන සක්සඟළ මාගේ සම්පත් බොහෝ ව ඇති බැවින් රත්රනින් වුවත් රිදියෙන් වුවත් මුතුමැණික් ආදියෙන් වුවත් තොප කියාලූ තරමෙක කරවා දෙමි. වුවමනා තරමක් කියව' යි බත් පමණකින් හා යම්තම් මිලයකින් කරවා දීලිය නොහී කුණ්ඩලාභරණය තුමූ ම කොට දුන් තැනැත්තෝ 'සත්රුවනින් සක්සඟළක් කරවා දෙමි' යි කිවුය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව්පුත් 'මේ තමාගේ පුතුට බෙහෙත් පමණක් වුවමනා ලෙස නොකරවා පැන් වත්කළ මනා ගසට හුණුපැන් වත්කරන්නා සේ නොබෙහෙද් බෙහෙත් කොට මරා තබාලා දැන් පුතණුවන් සැටියේ ආ මා කී දෙයක් කරවා දෙමී කියයි. තරයේ ම මූ වකිත කරවා ලමි. කෙසා විතර සක්සඟළක් කරවා දෙවූ දැ' යි විචාළහ. 'තොප කී විතෙරකැ' යි කී කල්හි, 'මාගේ රථමැදිරිය ගනරන්මුවා ය. එසේ හෙයින් ඊට තරම් වතොත් හිර හා සඳ ය. ඒ දෙක සම්භ වී නම් ගමන් බලාලූ කලට ජවනහංස ජාතකයෙහි හංසරාජ ව උපන් බෝසතුන් කිසිවිටෙක පසුබටත් සෙස්සවුන්ට පසුබැස්මක් නැති හෙයින් ඉතා බලවත. එසේ හෙයින් හිර හා සඳ සම්භ වී නම් ඒ මාගේ රථය හොබ්බී. සෙසු **සක්වලින්** ප්‍රයෝජන නැතැ" යි කිව.

(i) බමුණා, තම පුතුට බෙහෙත් කළ ආකාරය නිරූපණය කෙරෙන උපමාව කුමක් ද?
(ii) මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා තමාගේ රථයට ගැළපෙතැයි කී චක්‍ර යුගලය කුමක් ද?
(iii) "නොබෙහෙද් බෙහෙත් කොට මරා තබාලා" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'සක්වලින්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) එවේලෙහි ජීවකයෝ සිටාණන් ඇඳෙක උඩු බලා වැදහොවා සියලඟ නොසැලෙන සේ ඇඳ හා එක් කොට පටපිළියෙන් වෙළා සිටාණන් ඉස්දොර වැදහිඳ සූක්ෂ්ම වූ සැතක් ගෙන සිටාණන් ඉස්බොල්ල පළා තුන් සන්ධිය වෙන් කොට ඉස්මුල් කන පණුවන් දෙදෙනා සැත්තුඩින් ගෙන එළියේ ලූහ. එළියේ ලා "මේ සත්දවසින් කා මරන පණුය. මේ පස්දවසින් කා මරන පණුය" යි කියා පෑහ. ඒ විස්ම දුටු මහපිරිස එකවිට ම සාධුකාර දුන්හ. එවේලෙහි ජීවකයෝ සිටාණන් හිස්බොල්ල පෙර සේ ම සන්ධි කොට ලොමකුත් අඩුවැඩි නොකොට තබා **බැහැනි ගෙන** ඖෂධ ගල්වා සිටාණන් සත්දවසක් එම ශය්‍යාවෙන් සතපා දකුණැලයෙන් සත්දවසක් සතපා. වමැලයෙන් සත්දවසක් සතපා පෙර එක් විසිමසක්ට නියම කරවාගත් පිළියම එක්විසිදවසින් ගොඩනගා සිටාණන් හිස්මුල් අටගන්වා පැළූ තැන නොපෙනෙන සේ වණය සුව කළහ.

(i) ඉස්මුල් කන පණුවන් ඉවත් කිරීම සඳහා සැත්කම සිදු කළ ආකාරය කෙබඳු ද?
(ii) සැත්කමෙන් පසු වණය සුව වීමට ගත වූ කාලය කොතරම් ද?
(iii) "සිටාණන් හිස්මුල් අටගන්වා පැළූ තැන නොපෙනෙන සේ වණය සුව කළහ" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'බැහැනි ගෙන'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඉ) "සොඳුර තොප ඉණ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න. එතර තිබා අවුත් තොප කැඳවා ගෙන යෙමි" කියන්නා "යහපතැ" යි ඒ තියාවට තමා ඉණ තිබූ ඉණ කඩෙහි තමා **පලන්** ආභරණ ගලවා බැඳ දී ලන්නා සොර දෙටු ඇරගෙන ගඟින් එතර පීනා ගොස් යන්ට ආකාර දක්වාලී ය. ස්ත්‍රිය කියන්නී "ඇයි ස්වාමි පුත්‍රයාණෙනි, මා ඇර පියා නික්මුණු තියා දැ?" යි කියන්නී "තොපගේ පරණ සමණන්ට කළ දැ දුටු කල මට තමා ම වේ ද? තිගෙන් මට ප්‍රයෝජන නැතැ" යි කියා නික්මුණාහ. ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නී ය. ශක්‍රයෝ මෙපවත් දැන පඤ්චසිඛයා හා මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා කියන්නාහු "අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උව මැනවැ" යි කියා පඤ්චසිඛයා උකුසු වෙසක් හා මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැණහිල් වෙසක් මවාගෙන කටින් දඩ මස් කැටියක් ඩැ ගෙන...

(i) මෙම ඡේදයෙහි සඳහන් පරිදි සොර දෙටුවා ස්ත්‍රිය අත හැර යෑමට හේතු වූ කාරණය කුමක් ද?

(ii) ස්ත්‍රිය වෙහෙසට පත් කිරීම සඳහා ශක්‍රයා තව කී දෙනකු කැඳවූයේ ද?

(iii) "තොප ඉණ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**පලන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) මෙසේ උද්දාලබ්‍රාහ්මණයා විසින් කියන්නාවූ ඒ වචනය අසා ඔහුගේ මිත්‍ර ජනයෝ එක් ව කියන්නාහු "එම්බා ආචාරිනී, තෙපි දැන් යම් ස්ත්‍රියක් ප්‍රාර්ථනා කරා නම් ඕතොමෝ උත්තම ජාතීන් විසින් සහවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය; කිමෙක් ද ආචාරිනී, ඉතා ළං විය නොහැකි දුගඳ පිළිකුල් වූ අපවිත්‍ර අමේධ්‍යය හා මනෝඥ වූ සුවඳ විහිදුනා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක කෙසේ නම් එක් වේ ද? සමාන නොවන හෙයින් එක් නොවන්නේ මය; එබැවින් කිසි කලෙකත් එක් නුව මනා හීනජාතීන් හා සහවාසය කරන්නාවූ උත්තම සත්වයාගේ ශ්‍රී කාන්තාවය කීර්තිය ආයුෂය ශරීරබලය නුවණය යන මෙකී සියල්ල ම ඔහු අත්හැර දුරු ව පලා යන්නේය; එතෙම කෙළවර බොහෝ **අයශස්** අසා නින්දාවට පැමිණෙන්නේ" යි කීහ.

(i) මෙම ඡේදයෙහි දැක්වෙන පරිදි කවර කලෙක වත් එක් නො වන්නා වූ වස්තු **දෙක** කවරේ ද?

(ii) උත්තම සත්ත්වයා වෙතින් පලා යන කරුණු කීයක් මෙහි සටහන් වේ ද?

(iii) "ඕතොමෝ උත්තම ජාතීන් විසින් සහවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අයශස්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ) නැත රිවි රැස් පහ ස
නොපිපෙන තඹුරු වන ලෙ ස
ඔහු වෙණ නදින් මි ස
අනික් නදකින් අපි නොවෙමු තො ස

**දුමන** මුල් ඉඳු රූ
ලවන ලොබ ලිය පඳු රූ
එවෙණ නද මියු රූ
සවන නොකරන කෙනෙක් කවු රූ

(i) 'ලොබ ලිය' යන්න කවර අලංකාරයකට අයත් වේ ද?

(ii) දෙ වන පද්‍යයෙහි 'වීණා නාදයෙහි මිහිරි බව' දැක්වීමට කරුණු කීයක් දක්වා තිබේ ද?

(iii) "නොපිපෙන තඹුරු වන ලෙස" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දුමන**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

- **(ඉ)** සහ **(ඊ)** ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

**(ඉ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "තොප මට සිනාසෙන්ට කාරණා කිම් ද?"

(ii) "සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි."

(iii) "කවර දවසෙක අවුත් කොයිදී මා හා කථා කළේ දැයි?"

(iv) "මරණ නම් අදය සෙටය යි දැනගත නොහැක්ක; ඒ නියමයෙක් නැත."

(v) "අනේ, අප්පොච්චියෙ, ඔච්චර ම යි අපි ළඟ තියෙන්නෙ, අපි බොහොම අසරණ මිනිස්සු."

(vi) "ඉබ්බ දියට දමන කොට ඇන්නෑවෙ කියපි යන කියමන මට සිහි විය."

(vii) "යෞවනයේ සුවඳ මල් ද
යෞවනයේ මිහිරි පල ද
සරසවියගෙ පුදසුන මත
මැලවී ඇත තුබූ අයුරු."

(ලකුණු 03 x 4 = 12 යි.)

**(ඊ)** වස්තු විෂය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**සමනොලයෙකුට**

තුඹතල ළහිරු බබළයි උණුසුම් ය පවත්
බිඟුකැල උරයි වන මල් රොන් රසය නවත්
එහිලොල නොවී පියඹා ආ ගමන මෙවත්
සමනොල මිතුර නුඹට යි මගෙ ආයුබොවන්

ද ඔ රන් සුණෙන් හෙබි සිරියල් තලාවක
සුබ සිරි හඳුන්වා සුපුරුදු වෙලාවක
සිඹ සිඹ කුඩා ගස් වන මල් බලා නෙක
නුඹ ආ ගමන සීපද ගායනාවෙක

ගණනිල් තණග පිනි ටික ටික මැකෙද්දී
සුවිසල් අරුණු දද පෙරඹර දිලෙද්දී
රොනවුල් සුළං රැළි දකුණෙන් වැදෙද්දී
සිරියල් බිමෙක වි ද නුඹ හිරු නැඟෙද්දී

හේන්වල මුවන් වට පිට බලද්දී
රාං කුරුල්ලන් තුති ගී කියද්දී
පාන්දර හීන් හිරිකඩ වැටෙද්දී
තේන්, හඳුනන්ට බැහැ මල් පිපෙද්දී

තම තුනු කැලුම් සිලිලෙන් නැහැවෙවී වරෙන්
මල් වාරමක ගතියෙන් නැළවෙවී වරෙන්
කවුරුත් නුඹට ආදරයයි, එදැන වරෙන්
සමනොල පුෂ්පරාගය මා ළඟට වරෙන්

(ලකුණු 12 යි.)

**2. (අ)** "සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අරමුණ වූයේ, ධර්මය දැන, පින්කම් කිරීමත්, එමගින් නිවන් සාදා ගැනීම සඳහා සත්පුරුෂයන් මෙහෙයවීමත් ය." මෙම ප්‍රකාශනය නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් විමර්ශනයට ලක් කරන්න.

**නැත හොත්**

**(ආ)** "ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේ ම දුර්වලතා සහ ප්‍රබලතා හඳුනා ගෙන ධර්මෝපදේශ මාර්ගයෙන් ජනතාව යහමගට ගැනීමට ජාතක කථා කර්තෘවරුන් ප්‍රයත්න දරා ඇත." නියමිත කථා වස්තුවලින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි.)

**3.** **(අ)** සමාජයෙන් පැන නගින විවිධ අභියෝගවලට කාන්තාව මුහුණ දෙන ආකාරය නිරූපණය කිරීමෙහි ලා සද්ධර්මාලංකාර කතුවරයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

**(ආ)** පූජාවලී කර්තෘවරයා අප්‍රධාන චරිත රාශියක් උපකාරී කොට ගැනීමෙන් ප්‍රධාන චරිතය ඉස්මතු කොට දැක්වීමේ ශිල්පීය උපක්‍රමය භාවිත කොට ඇති ආකාරය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**4.** **(අ)** කෝට්ටේ අවධියෙහි සිංහල පද්‍ය කාව්‍යයේ උන්නතියට තුඩු දුන් තත්කාලීන සමාජ-සංස්කෘතික පසුබිම කරුණු **තුනක්** වත් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 07 යි.)

**(ආ)** "සිද්ධි තෝරා ගැනීමත් ඊට අනුගත චරිත ක්‍රියාත්මක වන ආකාරය මනා ලෙස දැක්වීමත් නිසා ගුත්තිල කාව්‍යයේ කථා ශරීරය අර්ථවත් වී තිබේ" තෝරා ගත් සිදු වීම් **තුනක්** වත් ඇසුරෙන් උක්ත කාරණය විමර්ශනය කරන්න. (ලකුණු 08 යි.)

**5.** "ලෙනාර්ඩ් වුල්ෆ්ගේ වෑයම වූයේ, යටත් විජිත පාලනයේ පැවති යථාර්ථය හඳුනා ගැනීමත් එය කලාත්මක ව නිරූපණය කිරීමක් ය." බැද්දේගම නවකථාව ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**6.** කෙටිකතාවක "ජීවන දෘෂ්ටිය" යනු කුමක් දැයි පැහැදිලි කොට, එය ඇරැව්වල නන්දිමිත්‍රගේ 'නංගී' කෙටිකතාවේ පිළිබිඹු වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

**7.** වර්තමාන සමාජ ක්‍රමය තුළ මාපිය-දූදරු අන්තර් සම්බන්ධතාවල පැවැත්මත්, ඒවා බිඳ වැටීමත් පිළිබඳ ඛේදවාචකය නිරූපිත ආකාරය නිර්දිෂ්ට පද්‍ය රචනා **තුනක්** වත් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**8.** "ආචාර්ය-ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම වූ අභිමතාර්ථ සපුරා ගැනීමට දරන උත්සාහය නිමාවට පත්වන්නේ මහත් වූ ව්‍යසනයකිනි." පෙමතො ජායතී සොකො නාට්‍යය ආශ්‍රයෙන් සනිදර්ශන ව පහදන්න. (ලකුණු 15 යි.)

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙතෙක් තහවුරු වී ඇති අදහස නම් මේ ස්ත්‍රීරූප දිව්‍යාප්සරාවන්ගේ ය යනු යි. එම අදහසෙහි බොහෝ දෙනකුගේ සිත් ඇලීගන්නා සේ ද පෙනේ. රූපවල යටිකය කෙටි කර දක්වා තිබීම හා මෙසකුට නිරූපණ වශයෙන් විස්තර කොට ඇති දෘශ්‍යමාන තෙලිතුඩු පහරවල් ද මෙම සිද්ධාන්තයට තුඩු දෙන ප්‍රධාන කරුණු ගණයෙහි වැටේ. මෙම රූප සැබෑ වශයෙන් ම මනුෂ්‍ය රූප යැයි ද ඒවා තත්කාලීන රාජසභාවෙහි වූවන්ගේ යැයි ද තහවුරු කළ හැකි ය. ඇතැමක් ජීවමාන ප්‍රමාණයට වඩා විශාල වන සේ හා ඇතැමක් කුඩා වන සේ ශරීරයෙන් හතරෙන් තුන් කොටසක් පමණක් පෙනෙන අයුරින් රූප සිත්තම් කර තිබීම ඇස් හමුයෙහි මායාවක් මවා පෑම් පිණිස හා ඒ නයින් පර්වත කෙවෙනියෙහි වූ සීමාසහිත අවකාශයෙන් හැකි තරම් ප්‍රයෝජන ගනු පිණිස යොදා ගන්නා ලද අවශ්‍ය ශිල්පීය උපක්‍රම වී යැයි විස්තර කළ හැකි වේ.

රූපවල සම්පූර්ණ ශරීරය ම සිතුවම් කිරීමට ප්‍රයත්න දරන ලද නම්, චිත්‍ර ශිල්පියාට ලැබුණු අවකාශයෙන් නිසි සේ ප්‍රයෝජන ගත නො හැකි වනු පමණක් නො ව චිත්‍ර ප්‍රකට ව පෙනෙන සේ නිරූපණය කිරීමට ද ශිල්පියා නොසමත් වනු ඇත. කෙසේ වුව ද සෑහෙන දුරක් පහතින් සිට නිරීක්ෂණය කරන කල ඒවායේ නියම අගය මතු වී පෙනෙන හෙයින්, මෙම චිත්‍ර කිට්ටුවෙන් සිට බැලීමට කිසි කලෙකත් අදහස් කරන ලදැයි නො සිතේ. එබඳු කලින් තෝරා පිහිටුවන ලද නිරීක්ෂණ ස්ථානයක් කලෙක දී තිබෙන්නට ඇත. එහෙත් එබන්දක කිසිදු ලකුණක් මේ තාක් සොයා ගෙන නැත. ශිල්පීය උපක්‍රමය තවත් තර කෙරෙන ලෙස රූප ජීවමාන ප්‍රමාණයට වඩා විශාල කර ඇඳ තිබේ. කිසිදු වලාකුළු නිරූපණයක්, මෙහි වේ නම්, ඒවා රූප වෙන් කොට දැක්වීමෙන් නිරීක්ෂණයට පහසුවක් සලසා ලීම සඳහාත් අහසෙහි සිටින ආකාරය හඟවන සියුම් පෙනුමක් ඇති කරවනු සඳහාත් එසේ ම චිත්‍ර මතු පිට ප්‍රකර්ෂවත් ආලෝකයක් වැටෙනු වළක්වනු සඳහාත් චිත්‍රවල ඉදිරි කොටසෙහි දක්වන්නට ඇත; අන් කිසිදු අර්ථයක් පිණිස නො වේ. මෙම චිත්‍රවල නිර්මාණය හා මේබඳු අදහසක් වඩාත් ම පහසුවෙන් ගැළපෙයි. තව ද, සතරේ පේළි වශයෙන් පිළියෙල කරන ලද රූප පන්සියයක් පමණ මුල දී මෙහි තිබූ බව ද මෙහි දී සැලකිය යුතු වෙයි. මෙම මතයට දෙවියන් පිළිබඳ අදහසක් රුවා ලීමට ඇති ඉඩ, රූපවලින් ප්‍රකාශ කෙරෙන හැඟීමෙන්, ඉරියව්වෙන් හා මිනුෂ්‍ය වර්ග විශේෂවලින් ද ඇවිරේ.

අනේකප්‍රකාර අලංකාරවත් ඇඳුමින් හා ආභරණවලින් සැරසුණු මේ කාන්තාවන් මහා උත්සවයකට සූදානම් වන්නන් විය හැකි ද? උත්සව අවස්ථා කිසි විටෙකත් ගැඹුරු කල්පනාවෙහි යෙදී සිටින අවස්ථා නො වී ය. ප්‍රීතිය කෙරෙහි නැමුණු සිතෙහි පැන නගින ප්‍රකර්ෂවත් හැඟීම්, ශරීරය හා අත්පා විශේෂයෙන් ම මුහුණ නමැති කැඩපතින් පිළිබිඹු විය යුතු යි.

(i) මෙම ස්ත්‍රී රූපවලින් නිරූපණය වන්නෝ දිව්‍ය අප්සරාවෝ ය යන අදහස පිළිගත හැකි සාක්ෂ්‍ය මොනවා ද?

(ii) දෙවියන් පිළිබඳ අදහස හුවා දැක්වීමට ඇති ඉඩකඩ ඇහිරීම (ඇවිරීම) කෙරෙහි බල පාන සාධක මොනවා ද?

(iii) ඉහත ඡේදයට අනුව මෙහි ඇඳ ඇති රූප සැබෑ වශයෙන් ම කවරකුගේ යැයි තහවුරු කළ හැකි ද?

(iv) වලාකුළු නිරූපණය මගින් අපේක්ෂිත කරුණු කීයක් මෙහි දැක්වේ ද?

(v) රූපවල සම්පූර්ණ ශරීරය ම සිතුවම් කිරීමට ප්‍රයත්න දරන ලද නම් චිත්‍ර ශිල්පියාට මුහුණ දීමට සිදු වන අපහසුකම් මොනවා ද?

(vi) මේ කාන්තාවන් මහා උත්සවයකට සූදානම් වන්නන් නො වන බව සිතීමට බල පාන ලක්ෂණය වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු $02 \times 6 = 12$ යි.)

[පස්වැනි පිටුව බලන්න.

**(ආ)** පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලාංකික සිසුනට ඉගැන්වීමේ දී තමන් යුරෝපයෙහි පුරුදු ව සිටි ක්‍රමවලින් තරමක් දුරට ඈත් වීමට මිෂනාරීනට සිදු විය. එසේ වූයේ මේ දිවයිනෙහි ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු බොහෝ දුරට පුරෝගාමී ස්වභාවයක් ගත් නිසා ය.

මෙහි දී ඔවුනට යුරෝපයෙහි දී මෙන් නො ව ශිෂ්‍යයාගේ ස්මරණ ශක්තිය කෙරෙහි වැඩි බලාපොරොත්තු තබන්නට සිදු විය. ශිෂ්‍යයනට කියවීම පවා බැරි අවදියේ දී ම ආගමික ශික්ෂා වනපොත් කරවන ලදි. මෙසේ ස්මරණ ශක්තිය කෙරෙහි බලාපොරොත්තු තැබීමට සිදු වූයේ එක් අතෙකින් පොත් හිඟවීම, විශේෂයෙන් දේශීය භාෂාවලින් රචිත පොත් හිඟ වීම ද අනෙක් අතින් විධිමත් අධ්‍යාපනයක් සඳහා පහසුකම් නොමැති වීම ද නිසා ය. තව ද, එකල පැවති තත්ත්වය අනුව ශිෂ්‍යයන් ලවා වාච්‍ය ශුද්ධ ලියවිලි කොට්ඨාස වනපොත් කරවීම වූකලී, ඔවුන් කියවීමට පුරුදු වීමෙන් පසු කෙරෙන පොත් පරිශීලනයෙන් ලබන ඉගෙනුමට වඩා, ඔවුනට ක්‍රිස්තියානි ලබ්ධියෙහි මූලික දේශනා පිළිබඳ ව කඩිනමින් දැන ගැනීමට සැලැස්විය හැකි ක්‍රමයක් විය. ආගම් ඉගෙනීම කෙතරම් වැදගත් හා කෙතරම් අත්‍යවශ්‍ය වී ද යත් ශිෂ්‍යයන් කියවීමට උගන්නා තෙක් එය පමා කළ හැකි නො වී ය. මේ වනාහි ප්‍රැන්සිස් සාවියර් අනුගමනය කළ ක්‍රමය ම යි. එනම්, ශිෂ්‍යයන් ලවා පාඩම් වනපොත් කරවා ඔවුනට එම වළක්වනු වස් නැවත නැවත කීමට සැලැස්වීම යි.

වනපොත් කිරීම මේ රටෙහි පාරම්පරික ඉගැන්වීමේ ක්‍රමය වූ හෙයින් ලාංකික ශිෂ්‍යයා ද නිසගයෙන් ම මෙන් මේ කාර්යයට හුරු වන්නට ඇත. ඇත්තෙන් ම, පුරා සිය වසර ගණනාවක් ම ආගමික හා වෙනත් ග්‍රන්ථ සම්පූර්ණයෙන් ම මුඛ පරම්පරාවෙන් පැවතුණා පමණක් නො ව මේ කාර්යය පහසු කරනු වස් නිඝණ්ඩු, ව්‍යාකරණ හා වෛද්‍ය ග්‍රන්ථ බඳු කෘතීන් පවා පැදියෙන් ලියන ලද්දේ ය. මෙසේ මිෂනාරිහු ලාංකික ශිෂ්‍යයන්ගේ වනපොත් කිරීමේ හැකියාව ප්‍රශංසා මුඛයෙන් වර්ණනා කරති.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) පුරා වස්තු සංරක්ෂණයෙහි ලා රජය සහ මහජනතාව සතු කාර්යභාරය

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම පාලනය කිරීමේ කාලීන අවශ්‍යතාව

(iii) මෙරට සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ දී සාම්ප්‍රදායික සංස්කෘතිකාංගවලින් ලැබිය හැකි දායකත්වය

(iv) පොලිතීන් භාවිතය අවම කිරීමට අනුගමනය කළ හැකි උපාය මාර්ග

(v) දේශපාලන බල පෑම්වලින් තොර වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමේ වැදගත්කම

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කළමනාකාරතුමා හෙවත් කළමනාකාරතුමිය උත්සවයට සහභාගි වෙයි.

(ii) අපි රටට හිතැත්තෝ වෙමු.

(iii) සමාජයෙහි සිවුපාවෝ වැනි මිනිස්සු ඇත.

(iv) ධාවන තරඟයෙන් ජය ලබන්නී කුමුදුනී ය.

(v) ගොවියන් වනාහි රටට බත සපයන්නෝ ය.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) මහා පරාක්‍රමබාහු රජ්ජුරුවෝ පරාක්‍රම සමුද්‍රය තැනවූහ.

(ii) කම්කරුවෝ මාර්ගය දෙපස ගස්වල අතු කපති.

(iii) අධ්‍යක්ෂවරයා සේවිකාවක කර්මාන්ත ශාලාවෙන් නෙරපා හරියි.

(iv) තාත්තා මේ ජීවිතයේ ඉහළට ම මා ඔසවා තැබුවේ ය.

(v) සෙන්පතියා තොපට පලවා හැරියේ ය.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) මුහන්දිරම්තුමා (ධනවතෙක් ද බලවතෙක් ද/ධනවතකු ද බලවතකු ද) (වෙයි/වෙති.)

(ii) හෙළයේ මහා ගන්ධර්වයා (හෙවත්/නොහොත්) ඩබ්ලිව්. ඩී. අමරදේව දක්ෂ (ගායකයෙක්/ගායකයකු) විය.

(iii) (මම/මා) ධනසිරි නම් (ව්‍යාපාරිකයෙක්/ව්‍යාපාරිකයකු) වෙමි.

(iv) බොහෝ (කම්කරුවන්/කම්කරුවෝ) වැඩ වරද්දී (ඇතැමෙක්/ඇතැමකු) වැඩට යති.

(v) නිවහල් දේශයක් උදෙසා (මිනිස්සු/මිනිසුන්) ජීවිතය කැප කළ (යුත්තේ ය/යුත්තෝ ය.)

(ලකුණු 05 × 3 =15 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **නිරතුරු සුමිතුරු** වෙස් ගත් කලණ මිතුරු තෙම **සුරතුර** බඳු වී ය.
(**නිරතුරු** - සන්ධි, **සුමිතුරු** - උපසර්ග, **සුරතුර** - සමාස)

(ii) කාන්තාවගේ **නෙතග** රැඳි කඳුළ ද මුවග **රැඳි** සිනහව ද අවියට වඩා **බලවත්** ය.
(**නෙතග** - සන්ධි, **රැඳි** - කෘදන්ත, **බලවත්** - තද්ධිත)

(iii) **අනුකම්පා** විරහිත **පාලකයෝ** ජනයාට දුක් **දී** පීඩාවට පත් කරති.
(**අනුකම්පා** - සමාස, **පාලකයෝ** - විභක්ති, **දී** - ක්‍රියා)

(iv) **විදෙස්** රටවල පවා **පතළ** කීර්තියක් ඇති උගත්තු **ලංකාවෙහි** ඇත.
(**විදෙස්** - උපසර්ග, **පතළ** - කෘදන්ත, **ලංකාවෙහි** - විභක්ති)

(v) උන්මාදචිත්‍රාවෝ **නෙතුපුලින්** ද රතදරින් ද **සිහිනිගින් ද** ශෝභමානයෝ ය.
(**නෙතුපුලින්** - සමාස, **සිහිනිගින්** - සන්ධි, **ද** - නිපාත) (ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ගුණවත්, ..................... දරු පරපුරක් බිහි කිරීමට විෂයමාලා සංශෝධනයක් අත්‍යවශ්‍ය ය.

(ii) ........................ දමින් බැඳී ජීවත් වීමට සියලු පුරවැසියන් අදිටන් කර ගත යුතු ය.

(iii) ජනේලය විවෘත කළ වහා ම ........................ වාතාශ්‍රය කාමරයට කඩා වැදුණේ ය.

(iv) ........................ බීම අධික ව පානය කිරීම ශරීර සෞඛ්‍යයට හානිකර ය.

(v) අනතිමානී ව කටයුතු කිරීම ........................ පුද්ගලයාගේ ප්‍රමුඛ ලක්ෂණයකි.

(vi) කෙතරම් චිත්ත පීඩා පැමිණිය ද ඔවුන් අතර වූ ........................ ප්‍රේමය මඳකිනුදු අඩු නො වී ය.
(සහෝදර, නැණවත්, සොයුරු, සිසිල්, ඥානවන්ත, ශීතල)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත දක්වා ඇති පද විසන්ධි කර ලියන්න.

(i) අපතර (ii) විෂමාචාර (iii) අද්දැකීම

(iv) සුළැඟිල්ල (v) දැත (vi) මංගලෝත්සව

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ගොවියා නගුලෙන් සී** සෑවේ ය.

(ii) **බළලකු මල්ලෙන්** එළියට පනින අයුරු මම දුටුවෙමි.

(iii) **දරුව, තලියේ** කිඹුලන් නො දකින්න. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

යාචකයා මල්ල කරෙහි ලා, හැරමිටිය අතින් ගෙන ගෙවුණු පාවහන් පයෙහි ලා ගමන් ඇරඹුවේ ය. විශාල ගේට්ටුවක් සහිත නිවසකට ඇතුළු වීමට සැරසෙද්දී "තෝ යන්නේ කොහේ ද යි මුරකාරයා කෑ ගැසී ය. අනේ මට බඩගිනියි හොඳට ම පිපාසයි; කලන්තෙ දාන්න වගෙයි."

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම ශ්‍රී ලංකාව වංචාවෙන් හා දූෂණයෙන් මුදවා ගනිමි"යි ජනාධිපති කී ය.

(ii) "ශිෂ්‍යයෝ උනන්දුවෙන් හා කැපවීමෙන් වැඩ කළ යුත්තාහ"යි විදුහල්පතිතුමා පැවසී ය.

(iii) "නඩුකාරතුමනි, මාගේ දරුවා නිදහස් කරන්න"යි කාන්තාව පැවසුවා ය.

(ලකුණු $01 \times 3 = 03$ යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාවන්තිස්ස නරදේවයාණෝ තම දරුවන් දෙදෙනාගේත් රටේත් අනාගතය ඉතා දූරදර්ශී ව සැලසුම් කළහ. ඊට නොදෙවෙනි ව තම පුතුන් දෙදෙනාගේ අනාගත අපේක්ෂාවන් මස්තකප්‍රාප්ත කිරීමෙහි ලා විහාර මහාදේවිය අධිකතර උත්සාහයක නිරත වූවා ය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ලක්දිව නානා ප්‍රදේශයන්හි විසූ **නන්දිමිත්‍ර, වේළුසුමන, ගෝඨයිම්බර, බෘද්වදේව, පුස්සදේව, ලභිය, ථේරපුත්තාභය** ආදි යෝධයන් ගෙන්වා ගැමුණු කුමාරයා පිණිස සේනාව සංවිධානයෙහි ලා දෘඪතර උත්සාහයක් දැරූහ. මේ අතර තිස්ස කුමාරයා සහලින් රට ස්වයංපෝෂිත කිරීම පිණිස ගොවිතැන් සඳහා පිටත් කර හැරියහ. විටෙක කුමාරයන් දෙදෙනා භික්ෂූන් වහන්සේ ඉදිරියට පමුණුවා අසමගි නොවන බවටත් ධර්මයට විරුද්ධ ව පාපතර ක්‍රියාවන්හි නොයෙදෙන බවටත් ශපථ කරවූහ. මේ අනුව කාවන්තිස්ස යනු අනාගතය විනිවිද දැක අනභිභවනීය වූත් ශ්‍රේෂ්ඨතර වූත් සේවාවක් සිදු කළ රජ කෙනකු වශයෙන් හඳුනා ගත හැකි ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත නම් පෙළ අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) තුලනාර්ථයේ/වඩා යන අර්ථයේ තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iii) මෙහි ඇති ප්‍රථම පුරුෂ, අතීත කාල, බහුවචන ආඛ්‍යාත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) රජ්ජුරුවෝ, ථේරපුත්තාභය, දැරූහ යන වචනවල යෙදී ඇති පිල්ලම් වෙන වෙන ම ලියන්න.

(v) මෙම ඡේදයෙහි ඇතුළත් අඝෝෂ හා ඝෝෂ මහාප්‍රාණ **දෙකක්** අන්තර්ගත වචනයක් ලියන්න.

(ලකුණු $03 \times 5 = 15$ යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහාප්‍රාණ අක්ෂර

(ii) අව්‍යය සමාසයේ 'න' ආදි වර්ගය

(iii) මිශ්‍ර ක්‍රියාව

(iv) පුරුෂ ලිංග නාම

(v) ගෞරවාර්ථයේ තද්ධිත

(ලකුණු $05 \times 3 = 15$ යි.)

* * *

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 දන්තජ අක්ෂරවලින් ආරම්භ වන වචන සහිත වරණය තෝරන්න.

(1) දකුණ, දක්ෂයා, දත්, සතුට, වඳුරා
(2) දමනය, සිව, වතුර, ගම, වතුර
(3) දර, තරුව, යතුර, සතුට, අගය
(4) දළදා, නගරය, ධනය, ලංකාව, සමාජය
(5) දහස, අහස, වතුර, ධර්මය, ඉඩම

(.........)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ඔටුනු, ගවේෂනය, ආදුනිකයා, අනධ්‍යයන, සිඟුමැලි
(2) ඔටුනු, ගවේසනය, ආධුනිකයා, අනද්‍යයන, සිඟුමැළි
(3) ඔටුණු, ගවේෂණය, ආධුනිකයා, අනද්‍යයන, සිඟුමැලි
(4) ඔටුනු, ගවේෂණය, ආධුනිකයා, අනධ්‍යයන, සිඟුමැලි
(5) ඔටුණු, ගවේශණය, ආදුනිකයා, අනධ්‍යයන, සිඟුමැළි

(.........)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අඟහරු, පෘථිවි, සෙනසුරු, සිකුරු, බුධ
(2) අඟහරු, පෘථිවි, බුධ, සිකුරු, සෙනසුරු
(3) පෘථිවි, බුධ, අඟහරු, සෙනසුරු, සිකුරු
(4) අඟහරු, බුධ, සිකුරු, සෙනසුරු, පෘථිවි
(5) බුධ, අඟහරු, පෘථිවි, සෙනසුරු, සිකුරු

(.........)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න. **සිංහල අක්ෂර මාලාවේ**

(1) මහාප්‍රාණ අක්ෂර දහයක් ඇත.
(2) 'ය, ව' අන්තඃස්ථාක්ෂර නො වේ.
(3) අක්ෂර ගණන පනස් නවයකි.
(4) ආරම්භක අක්ෂරය විසර්ගය යි.
(5) 'ශ, ෂ, ස' ඌෂ්මාක්ෂර නො වේ.

(.........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ක්‍රීඩා ඇමති, කර්මාන්ත ශාලාව, ජාතික ව්‍යාපාරය, ස්වදේශ මිත්‍රයා
(2) දේව පූජාව, නියෝජ්‍ය විදුහල්පති, ස්ථිර අධිෂ්ඨානය, වෙළෙඳ ප්‍රජාව
(3) අත්කම් භාණ්ඩ, මහා සාගරය, වෛද්‍ය මන්දිරය, දේශීය නිපැයුම්
(4) ස්වභාෂා අලංකාරය, දහම් වැස්ස, සාහිත්‍ය මාසය, මිතුරු දම්
(5) රුක් රෝපණය, මනුෂ්‍ය ලෝකය, භේරී නාදය, සත සමුදුර

(.........)

[දෙවැනි පිටුව බලන්න.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) කුඹ, ගුඹ, තණ, අඹ
(2) සාධක, බාධක, අදක, වේදක
(3) සීල, කාල, දාන, නීල
(4) ඇත, නැත, ගත, යත
(5) දුෂ්ට, ඉෂ්ට, මිෂ්ට, අෂ්ට
( ... )

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අද, සද, පද, මද
(2) පෙම, දම, නැම, කුම
(3) අද, සද, පාද, මද
(4) මිතුරු, සතුරු, කර්තෘ, පවිත්‍ර
(5) දෙවි, සවි, බාහු, ධාතු
( ... )

1.8 විභක්ති, දකාරාර්ථ, අව්‍යය, විශේෂණ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) කොළුඉඳුල්, නිදොස්, ලණුපැදුර, හදවිල
(2) හදවිල, කොළුඉඳුල්, ලණුපැදුර, නිදොස්
(3) ලණුපැදුර, කොළුඉඳුල්, නිදොස්, හදවිල
(4) නිදොස්, හදවිල, කොළුඉඳුල්, ලණුපැදුර
(5) ලණුපැදුර, නිදොස්, හදවිල, කොළුඉඳුල්
( ... )

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) නැසුමින්, දෙසුමින්, උසුමින්, වැසුමින්
(2) නැරූ, ගේරූ, පැරූ, බෙරූ
(3) අඳින, වඳින, බිඳින, විඳින
(4) පැසුණු, නැසුණු, ගැසුණු, ඇසුණු
(5) පැළඹී, නැළඹී, වෙළඹී, පෙළඹී
( ... )

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**ගොස්** බරණැස් පුරට"
(ආ) "දුකින් දුරු **වේවා**"
(ඉ) "**අස** දැන් ත යන මඟ පලතුරු ගෙනැත් සිට"
(ඊ) "**කෙළිමින්** යෙති බැඳ කිතුරු"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(5) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
( ... )

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ප්‍රමුඛතම, මධුරතම, වෘද්ධතම, ප්‍රධානතම
(2) රූමත්, ධීමත්, ශ්‍රීමත්, දිවිමත්
(3) මුහුණත්, ලවනත්, දකුණත්, සවනත්
(4) ආගමික, ශාසනික, දේශපාලනික, සාංඝික
(5) දැවමුවා, මිණිමුවා, සෙල්මුවා, රන්මුවා
( ... )

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) නිරවුල්, නිලතුණු, නිවහල්, නිහඬ
(2) අභියාචන, අභිධර්ම, අභිජ්ජාන, අභිනන්දන
(3) අනුගමන, අනුමෝදනා, අනුධාවන, අනුක්‍රමික
(4) නිරනුමාන, නිරාගමික, නිරුත්තර, නිරන්තර
(5) සුසමිදු, සුමඟුල්, සුවහස්, සුපහන්
( ... )

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) නිරතුරු, නිති, නිතර, නිබඳ
(2) මිස, මුත්, විනා, හැර
(3) යළි, නැවත, ඉක්බිති, පුවත
(4) සමඟ, හා, සහ, කැටුව
(5) දක්වා, තෙක්, තාක්, පටන්
( ... )

1.14 "**විදුහල්පතිවරුන්ගේ සාමූහික** උත්සාහයෙන් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන තත්ත්වය **ප්‍රවර්ධනය** විය." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) විභක්ති, තද්ධිත, උපසර්ග
(2) උපසර්ග, විභක්ති, තද්ධිත
(3) උපසර්ග, තද්ධිත, විභක්ති
(4) විභක්ති, උපසර්ග, තද්ධිත
(5) තද්ධිත, උපසර්ග, විභක්ති ( .... )

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කෙරෙන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) බැන්දේ ය, ඇන්දෝ ය, වැන්දේ ය, සින්දෝ ය.
(2) දා, නා, පා, කෑ
(3) ලැබුවේ ය, ලැබුවා ය, ලැබුවෝ ය, ලැබුණේ ය.
(4) කරවයි, හරවයි, ලියවයි, බලවයි.
(5) අල්ලමු, ඉල්ලමු, දල්වමු, එල්ලමි. ( .... )

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කුද්දු, කුකවි, කුරුලු, කුපුරිස්
(2) දෙව්විමන, ළමාලොව, හංසනාදය, ඇස්පිහාටු
(3) පැන්පැන්සල්, දක්දෙසා, හට්ටිමුට්ටි, කොට්ටපැදුරු
(4) නිලකුණු, සදෙව්ලොව, පස්පියුම්, සත්කුළුපව්
(5) අනෞචිත්‍ය, අනාගත, අනාදර, අනල්ප ( .... )

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද සමූහයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඇදුම්දු, මහැදුරු, පියැදුරු, රජතුමා
(2) සකලාංග, ජනාධිපති, සාමාන්‍යාධිකාරී, මහෝපකාරී
(3) ගංතෙර, මුංඇට, රම්මිණි, පුළංඇල්ල
(4) මවුහොවුන්, අතිනත, දෙවගන, පසිඳුරන්
(5) පුෂ්පෝත්සවය, ග්‍රාමෝදය, ශ්‍රමාභිමානී, වෛද්‍යෝපදේශ ( .... )

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?

(1) ඉගටි, කපටි, කරටි, ඉහටි
(2) පාසිලුම්, රාගගින්න, කරුණාජලය, සසරදහවිව
(3) වෛශාරද්‍ය, වෛකල්‍ය, නෛපුණ්‍ය, වෛශාඛ්‍ය
(4) සාධනීය, වන්දනීය, ප්‍රාර්ථනීය, වින්දනීය
(5) කැවිලි, රැවිලි, දිවිලි, නැවිලි ( .... )

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) නායකයාණනි, අදීන වූවෙක් සේ කටයුතු කරන්න.
(2) ගුරුවරු මැනවින් උගන්වති'යි දෙමාපියෝ සිතති.
(3) අසත්පුරුෂයෝ වංචාකාරයෝ ද කෛරාටිකයෝ ද වෙති.
(4) මා නිදුක් වෙම්වා!
(5) අප නිසිගරුක පුරවැසියන් වෙමු. ( .... )

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.

(1) රටදැය නැගීමට වැඩ කිරීම පාලකයාගේ යුතුකම ය.
(2) කාක් කවුරුවත් නැති අහිංසකයන්ට පීඩා නොකළ යුතු ය.
(3) රටේ ධනයෙන් බාගෙට බාගයක් අතලොස්සක් වූ ජාවාරම්කාරයන් ළඟ ඇත.
(4) හීන්දෑරි මිනිහෙක් ගේට්ටුව ගාවට වී ගේ දිහා බලා සිටියේ ය.
(5) සිරිසේන පනිට්ටුව ළිඳට දමා වතුර එකක් අරන් ඇගේ හලා ගත්තේ ය. ( .... )

(ලකුණු 20 යි.)

※ ※